# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2043/51 – 2017 නොවැම්බර් 02 වැනි බ්‍රහස්පතින්දා – 2017.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුමුල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/ඩීඑස්ඕ/2016/445 හා 2016.08.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 01 – ඇලමුල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0316**
උතුරට: කැළණි ගඟ සහ කැබලි අංක 2; නැගෙනහිරට: කැබලි අංක 2; දකුණට: පී. ටී. කරුණාරත්න හිමිකම් කියන නම සොයාගත නොහැකි ඉඩම සහ කේ. ඩී. එන්. ආරියරත්න සහ තවත් අය හිමිකම් කියන ඇලමුල්ලවත්ත; බටහිරට: කේ. ඩී. එන්. ආරියරත්න සහ තවත් අය හිමිකම් කියන ඇලමුල්ලවත්ත.

02. **කැබලි අංක 02 – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0468**
උතුරට: කැළණි ගඟ සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: අවිස්සාවේල්ල පාර, පී. ටී. කරුණාරත්න හිමිකම් කියන නම සොයාගත නොහැකි ඉඩම සහ කැබලි අංක 1; බටහිරට: පී. ටී. කරුණාරත්න හිමිකම් කියන නම සොයාගත නොහැකි ඉඩම, කේ. ඩී. එන්. ආරියරත්න සහ තවත් අය හිමිකම් කියන ඇලමුල්ලවත්ත සහ කැබලි අංක 1.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2016/එල්ආර්බී/172.
2017 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 – 866


1A – G26536 – 22 (2017/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*